# 14 බෝසත් සෙවනැල්ල වන් යසෝධරා තෙරණියෝ

යසෝධරා දේවිය බෝසතාණන් වහන්සේ සමග ම සසර පෙරුම් පුරාගෙන ආ පිනිවන්තියකි. ඇය පෙරුම් පිරීම ඇරඹුවේත් දීපංකර සම්බුදු පාද මූලයේදී ම යි. ඒ කාලයේ ඇය සුමිත්තා නම් බ්‍රාහ්මණ කුමාරිකාවක්. බුදුරදුන් වැඩ පුදා ගන්නට රම්මවතී නුවර මග දෙපස රැස් කකා සිටි සෙනඟ අතර ඇයත් එදා මහනෙල් මල් අට මිටකුත් දෝතින් දරාගෙන සිටියා ය. සුමේධ තාපසයන් වහන්සේගේ අසිරිමත් ජීවිත පූජාව දැක ඇයට එතුමා ගැන මහත් ගෞරවයක් ඇති වුණා. එතුමාට දෙන්නට වෙන කිසිවක් නොතිබූ නිසා මහනෙල් මල් මිටි පහක් දී '' ස්වාමීනි, ඔබවහන්සේ මේ මල් වලින් බුදුරදුන් පුදනු මැනවි. මම මේ මල් මිටි තුනෙන් බුදුන් පුදන්නෙමි. එවිට ඔබ වහන්සේගේ බුදුවීමේ පැතුම වාගේ ම ඊට උපකාරවීමේ මගේ පැතුමත් ඉටුවනු ඇතැයි '' පැවසුවා. යසෝධරාව බෝසතුන්ට සහාය වීමට තීරණය කළේ එලෙස යි.

එදා ඇයගේ පින් මහිමය බලා වදාළ දීපංකර බුදුරජාණන් වහන්සේ සුමේධ තවුසාණන් අමතා ''තවුසාණෙනි, මැය ඔබ හා සම සිතින් පින් දහම් කරමින්, ඔබ යන ගමනට සහායිකාවක් වෙනවා. ඔබට ප්‍රිය මනාප වූ ඔබේ යහපතට ම කැපවන තැනැත්තියක් වෙනවා යැ'යි වදාළා. එතැන් පටන් එතුමිය බෝසතාණන් වහන්සේ උදෙසා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ කළ පින් දහම් අනන්ත යි. කළ කැප කිරීම් අප්‍රමාණයි. ඒ වාගේ ම බෝසතාණන් වහන්සේ ඇය අනුන්ට උපකාර වශයෙන් දන් දුන් වාර, බොහොමයි. ඒහෙත් ඒ කිසිවිටකත් ඇය උන්වහන්සේ ගැන අහිතක් හිතුවේ නැහැ. උන්වහන්සේගේ ප්‍රාර්ථනාව වෙනුවෙන් කැමැත්තෙන් ම ඒ සියලු දුක් ඉසිලුවා. අවසාන වෙස්සන්තර ආත්ම භාවයේ දීත් මන්ද්‍රී දේවිය වුණේ එතුමිය යි. එදත් වෙස්සන්තර රජතුමා ඇයව දන් දුන් බව ඔබට මතක ඇති.

මෙසේ අප මහා බෝසතාණන් වහන්සේ සමග එකට ම සසර මග ගෙවා ගෙන ආ එතුමිය කිඹුල්වත් නුවර සිදුහත් කුමරු උපන්

දවසේ ම මහාමායා දේවියගේ උපන් බිම වූ දෙව්දහ නුවර දී උපන්නා. ඇගේ පියා **සුප්පබුද්ධ රජතුමා** මව **අමිතා දේවිය යි**. යසෝධරා කුමරියට එක් සොහොයුරෙක් සිටියා. ඒ තමයි කවුරුත් හඳුනන දේවදත්ත කුමාරයා. යසෝධරා කුමරිය මනා රූ සපුවකින් යුතු නිසා බිම්බා නමින් ද සිරුර රන් වන් පාට නිසා භද්දකාඤ්චනා හෙවත් **භද්දකච්චානා** නමින් ද ප්‍රසිද්ධ වුණා.

## බෝසතුන් හා විවාහ වීම

තුරුණු වියට පත් බෝසත් සිදුහත් කුමාරයාට සුදුසු කුමරියක සරණ පාවා දෙන්නට සුද්ධෝදන රජ තුමාට උවමනා වුණා. එහෙත් සිදුහත් කුමාරයා විවාහ ජීවිතයකට කැමති වුණේ නැහැ. කම් සැප විඳීම පිළිකුල් කළ එතුමාට ඕනෑ වුණේ වන ගත වීමටයි. ඒත් පිය රජතුමාගෙන් ඊට අවසර නොලැබෙන බව එතුමා දැන ගෙන හිටියා. ඒ නිසා ආවාහය නොකෙරෙන්නට උපක්‍රමයක් යෙදුවා.

තමාට කුමරියක් පාවා දෙනවා නම් ඇය රූප මදයෙන් මත් නොවුණු, මසුරු නැති, මානය, කෝපය, කපටිකම, ඊර්ෂ්‍යාව, වංකකම යන දුර් ගුණයන්ගෙන් තොර පති භක්තිය ඇති තැනැත්තියක විය යුතුයි. රසයට කෑදර නැති, නැටුම් ගැයුම් වැනි ගාලගෝට්ටිවලට, සුවඳ විලවුන් වැනි දේට ගිජු නැති, අන්සතු දේට ආශා නොකරන, ඇත්ත කියන, සැපතේ දී උඩඟු නොවෙන, විපතේ දී නොතැවෙන, විළි බිය ඇති, සුභාසුභ නිමිති නො අදහන, කෙනෙකු විය යුතුයි. නිතර ම තුන්දොර පිරිසිදුව රකින, අලස කම් කුසීත කම්වලින් තොර, විමසා බලා කටයුතු කරන, නැදිමයිලන්ට දෙවියන්ට මෙන් ගරු කරන, දාසියක සේ යටහත්, මවක සේ කාරුණික කුමරියක ලැබුණොත් පමණක් විවාහයට එකඟවන බව සිදුහත් කුමරු කියා සිටියා.

සුද්ධෝදන රජතුමා ඒ කොන්දේසි පත්‍රයට ගැළපෙන කුමරියක් සොයන්නට දූතයන් රටින් රට යැව්වා. අවසානයේ දී ඔවුන් දෙව්දහ නුවර සුප්ප බුද්ධ රජතුමාගේ මාලිගයට පැමිණියා. එහි දී මේ තොරතුරු පත්‍රය කියවූ යසෝධරා කුමරිය. බමුණාණෙනි, "මේ කියන හැම ගුණයක් ම මා ළඟ ඇත. සිද්ධාර්ථ කුමාරයන් මාගේ ස්වාමියා වේවා යි එතුමාට කියන්නැ"යි දූතයන්ට පැවසුවා. ඔවුන් පෙරළා කිඹුල්වත් නුවර ගොස් ඒ පුවත සුදොවුන් රජතුමාට දැන්වුවා. රජතුමා එක් වර ම ඒ බව නොකියා කුමාරයාට ම කැමති කුමාරිකාවක් තෝරා ගන්නට ස්වයංවර උළෙලක් පැවත් වූවා. එම උත්සවයට

යසෝධරාවත් තවත් සියගණනක් කුමාරිකාවෝත් පැමිණ සිටියා. ඒ අතුරින් සිදුහත් කුමාරයා කවුරුදැයි නොදැන ම තොරාගත්තේ යසෝධරා කුමරිය යි. එහෙත් සුප්පබුද්ධ රජතුමා ඒ විවාහයට කැමැති වූයේ නැහැ. ඊට හේතුව සිදුහත් කුමරු කිසි ශිල්පයක් නොදන්නේ යැයි කා තුළත් පැවැති සැකය යි. අන්තිමේ දී කුමරු ශිල්ප දැක්වීමෙන් පසු ඥාති රජවරු තම දූ කුමරියන් කුමරුට පවා දීමට කැමති වුණා. සිදුහත් කුමරු ගැන උපදින විට ම බමුණන් කියූ අනාවැකියක් තිබුණා. ඒ එතුමා කවදා හෝ ගිහිගෙය හැර යන බවයි. එය සිහිපත් කළ සුප්ප බුද්ධ රජතුමා ''කුමරු ගිහි ගෙය හැර ගිය දාට ඔබ කනවැන්දුම් වෙනවා. ඒ නිසා ඔය විවාහය කර ගන්න එපා '' යැයි යසෝධරාවට කීවා. ඒත් ''පියාණෙනි, මා සරණ යතොත් යන්නේ සිද්ධාර්ථ කුමාරයන් සමග ය, එතුමා හෙට පැවිදි වුණත් එතුමා ළඟ මිස වෙනත් කෙනෙකු ළඟ නොවසන්නෙමි'' යි එතුමිය එක හෙළා කියා සිටියා. සිද්ධාර්ථ කුමාරයා පැවසුවේත් තමා යසෝධරා මිස වෙන කිසි කෙනෙකු සරණ පාවා නොගන්නා බව යි. අන්තිමේ දී දෙපැත්තේ ම නෑයන්ගේ කැමැත්තෙන් සරණ මංගල්‍යය මහ ඉහළින් සිදු වුණා. සුද්ධෝදන රජතුමා දෙදෙනාට ම එකවර කිරුළු පළඳවා ශාක්‍ය රටේ රජකම පැවරුවා.

සසර එකට ආ ගමනින් ඇති වූ ස්නේහය නිසා එකතු වීමට කැමැති වුණත් මේ දෙදෙනාට ම කම් සැප ගැන ආශාවක් තිබුණේ නැහැ. සෙනෙහෙබර සොහොයුරු සොහොයුරියන් දෙදෙනෙකු මෙන් ඔවුනොවුන්ට ලැදිව උපකාර කර ගෙන කල් ගෙව්වා. යසෝධරාවන් රජ ගෙදරට එන්නට පෙර සේවක සේවිකාවන්ට වෙනස් ආකාරයකට සැලකූ සැළකිලි එතුමිය වෙනස් කළා. රජ පවුලේ අයට දෙන රාජ භෝජනය ම ඔවුන්ටත් දෙන්නට සැලැස්සුවා එතැන් සිට ඔවුන් සැලකුණේ රජපවුලේ හිතමිතුරන් ලෙසටයි. රජ ගෙදර අය පමණක් නොව රට වැසියාත් යසෝදරාවගේ කරුණා ගුණය ගැන පැහැදී සිටියා. කිඹුල්වත් පුර වැසි සියල්ලෝ ම මවකට මෙන් ඇයට මහත් ආදර ගෞරව දැක්වුවා.

රජමාලිගාව කොතරම් සැප සම්පතින් පිරී තිබුණත් මේ දෙදෙනා විසුවේ තවුසෙක් හා තවුසියක විදියට යි. කවදා හෝ ගිහිගේ හැර ගොස් පැවිදි විය යුතුය යන්න දෙදෙනාගේ ම අදහස වුණා. ඒ නිසා විවාහ වී වසර දහතුනක් යන තුරු ඔවුනට දරුවෙක් සිටියේ නෑ. යසෝධරා දේවියගේ කුසේ දරුවකු පිළිසිඳ ගත්තේ බෝසතාණන් වහන්සේගේ විසි අට වෙනි වියේ දී එය සිදු වුණේත් රජ පරපුර පැවතිය යුතු නිස යි. යසෝධරා දේවියට දරුවා බිහිවූ දිනයේ ම සිදුහත්

කුමරු ගිහිගෙය හැර ගියා **අභිනිෂ්ක්‍රමණය** කියන්නේ එයයි. උපන් දරුවාට රාහුල යන නම තැබුවා. එතැන් පටන් එතුමිය රාහුල මාතා නමිනුත් හැඳින් වුණා.

තවුස් පැවිද්දෙන් පැවිදි වූ බෝසතාණන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළා. ඒ කාලය තුළ උන්වහන්සේ ජීවිතේ ගත කළ ආකාරය යසෝධරා දේවියට ආරංචි වුණා. ඒ තොරතුරු අසා උන්වහන්සේ බිම සැතපෙන නිසා ඇයත් ඇඳ පුටු පරිහරණය අත්හැරියා. උන්වහන්සේ කසාවත් හඳින නිසා ඇයත් සුවඳ විලවුන් ආදිය අතහැර කසාවත් හඳින්නට පටන් ගත්තා. උන්වහන්සේ කෙස්වැටිය සිඳ දැමූ බව අසා ඇයත් කෙස්වැටිය සිඳ දැමුවා. උන්වහන්සේ වගේ ම ඇයත් එක් වේලක් පමණක් ආහාර ගත්තා. මෙසේ තමන් තවුසියක සේ වෙසෙමින් රාහුල කුමරුත් රැකබලා ගත්තා.

බුදු වී නව මසකින් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර වැඩියා. රජ මාලිගයට වැඩි උන්වහන්සේට වඳින්නට එහි සිටි සියලු දෙනා ම ආවත් යසෝධරා දේවිය ආවේ නැහැ. තමා ළඟ ගුණයක් ඇත්නම් උන්වහන්සේ තමන් සිටින තැනට වඩිනු ඇතැයි කියා තම මැදුරට ම වී සිටියා. කාරණය තෙරුම් ගත් බුදුරජාණන් වහන්සේ අගසවු දෙනමත් සමග ඇගේ මැදුරට වැඩියා. ඒ වෙලාවේ එහි වැඩහුන් උන්වහන්සේ වෙත දිව ආ එතුමිය සිරිපා මුල වැටී දෙපා අල්ලාගෙන බොහෝ වෙලාවක් කඳුළු සලමින් වැන්දා. ඇයට ඇති තරම් හඬන්නටත් වඳින්නටත් බුදුරජාණන් වහන්සේ ඉඩ දුන්නා ඒ වෙලාවේ සුදොවුන් රජතුමා බෝසතාණන් වහන්සේ ගිහි ගෙය හැර ගිය දවසේ පටන් ඇය උන්වහන්සේ වෙනුවෙන් ජීවිතේ කැප කළ ආකාරය විස්තර කරමින් ඇගේ ගුණ කීවා. එවිට බුදුරජාණන් වහන්සේ "මහ රජ මැය සසර අනන්ත වාරයක් මා වෙනුවෙන් මෙවැනි කැප කිරීම් සිදු කර ඇතැ"යි වදාරා "චන්ද කින්නර ජාතකය" දේශනා කළා.

ඉන් සත් වෙනි දවසේ විසි දහසක් රහතුන් පිරිවාරා මහ මඟ වඩින බුදුරදුන් දුටු යසෝධරාවට ගිහිව සිටියදී රජ කුමරෙකු වශයෙන් නගර සංචාරය කළාට වඩා අද බුදුරජාණන් වහන්සේ වඩින ගමන කොතරම් අසිරිමත් දැයි සිතුණා. තමාගේ රාහුල පුතුට උන්වහන්සේ පෙන්වා ගාථා අටකින් උන්වහන්සේගේ සිරුරේ හිසේ සිට පාදාන්තය දක්වා මහා පුරුෂ ලකුණු අපූරුවට විස්තර කළා. නරසීහ ගාථා කියන්නේ ඒවායි. ඉන් පසු සිය පුතණුවන් පියාගෙන් දායාද ඉල්ලගෙන එන්නැයි බුදුරජාණන් වහන්සේ වෙත පිටක් කර යැව්වා. එදා උන්වහසේ රාහුල කුමරුන් පැවිදි කළා.

බුදුරජාණන් වහන්සේ රජගෙදරට වැඩි පළමු දවසේ ම යසෝධරා දේවියත් මහණවෙන්න කැමැති වුණා. තව ම මෙහෙණි සස්නක් ඇරඹී නැතැයි කියා උන්වහන්සේ එය වැළැක්වූවා. රාහුල කුමරුන් පැවිදි වූ පසු දරු සෙනෙහස දරා ගත නොහැකිව නැවතත් එතුමිය පැවිදි වෙන්නට සැරසුණා. එදා සුද්ධෝදන ජරතුමා වෙස්සනතර ආත්ම භාවයේ දී මන්ද්‍රී දේවිය වශයෙන් ඇය දරු දුක ඉහිලූ හැටි සිහිපත් කරමින් ඇය වැළැක්වූවා. බුදුවී වසර පහකට පසුව සුදෝවුන් රජු බුදුරදුන්ගෙන් බණ අසා රහත් වී පිරිණිවන් පෑවා. යසෝධරා දේවිය තුන්වෙනි වරටත් පැවිදිවන්නට සැරසුණා. එදා මහා ප්‍රජාපතී ගෝතමිය තමා කෙසේ හෝ කාන්තාවන්ට පැවිදි වන්නට අවරස ලබාගන්නා තුරු ඉවසන ලෙස කියා ඇය වැළැක්වූවා. ඒ වන විට ප්‍රජාපතී ගෞතමිය දෙවරක් ම කාන්තාවන්ට පැවිදිවන්නට අවසර ඉල්ලුවත් ඊට ඉඩ ලැබී තිබුණේ නැහැ.

අන්තිමේ දී මෙහෙණි සස්න ඇරඹුණා. එදා යසෝධරා දේවියත් මහා ප්‍රජාපතී ගෞතමිය ළඟ පැවිදි උපසම්පදාව ලැබුවා. නොබෝ කලකින් විදසුන් වඩා රහත් වුණා. එතුමිය සැවැත්නුවර වෙසෙන බව ආරංචි වී දැක බලා ගන්නට සෙනග වැළ නොකැඩී  පැමිණියා. විවේකය මඳ වූ නිසා එතුමිය බුදුරදුන්ගෙන් අවසර ගෙන එතැනින් පිටත් වී විශාලා මහනුවර ප්‍රජාපතී ගෞතමීන් වහන්සේ ළඟට ගියා. එහිදීත් එතුමියට විවේකයක් ලැබුණේ නැහැ. දුර බැහැර සිට නොයෙක් රට රාජ්‍යවල වැසියන් පවා එතුමියට සත්කාර කරන්නට පැමිණියා. යසෝදරා තෙරණිය අනතුරුව එතැනින් පිටත් වී රජගහ නුවරට පැමිණියා. එහි දීත් ලක්ෂ ගණන් ජනයා බුදුරදුන් වැඩියා සේ එතුමිය බැහැ දැක වැඳ පුදා ගත්තා. මෙසේ බෝධිසත්වයන් වහන්සේ සමග පිරූ දාන පාරමිතා අනුහසින් යසෝධරා රහත් මෙහෙණින් වහන්සේටත් පිරිවරින් හා ලාභ සත්කාරයෙන් අඩුවක් තිබුණේ නැහැ.

යසෝධරා තෙරණියට එක වර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් දුර අතීතය සිහි කිරීමට හැකි විශේෂ ඥානයක් තිබුණා. ගෞතම බුදුසසුනේ එවැනි අභිඥාවක් ලැබූ අය  සිව් නමක් සිටියා එනම් සැරියුත් මහ රහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ, බක්කුල මහරහතන් වහන්සේ සහ යසෝධරා මහරහත් මෙහෙණින් වහන්සේ ය. ඒ නිසා එතුමිය මහා අභිඥා නුවණ ඇති භික්ෂුණී අතර අග තනතුරු ලැබුවා.

වියපත් වූ යසෝධරා මෙහෙණින් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ හෝ රාහුල රහතන් වහන්සේගේ පිරිනිවීම දකින්නට කැමැති වුණේ නැහැ. ඒ නිසා ඒ දෙදෙනා වහන්සේට පෙර තමන් පිරිනිවන් පෑයුතු යැයි තීරණය කළා. හැත්තෑ අට වන වියේ දී බුදුරජාණන් වහන්සේ වෙත ගිය එතුමිය උන්වහන්සේ වැඳ තමාගේ ගෞරවය දක්වා, සසර පුරා ආ ගමනේ විශේෂ තැන් සිහිපත් කළා. අනතුරු ව තමාට නිවන් දකින්නට මග පෙන්වීම ගැන කෘතඥතාව ද පළ කළා. ඒ සියල්ල නිම වී උන්වහන්සේ අබියස ඍද්ධි ප්‍රාතිහාර්ය පෑවා. අනතුරුව වැඳ අවසර ගෙන ගොස් පිරිනිවන් පෑවා. බුදුරාජාණන් වහන්සේ මහසඟරුවන සමග වැඩම කොට එතුමියගේ සිරුරට රහතන් වහන්සේ නමකට කරන ගරු බුහුමන් පවත්වා ඇයගේ ආදාහන ද සිදු කරවා වදාළා. එතුමියගේ ශාරීරික ධාතු තැන්පත් කොට සෑයක් ඉදිකරවා උන්වහන්සේ එයට සියතින් ම මල් පිදුවා.

හිමයේ ගොසින් මල් යහනක නිදනවද
කෝමළ අනගි සිරිපා දෙක රිදෙනවද
හිගේ නැතිව දෙවියෝ මුර කරනවද
මගේ ඇත් රජුනි හිමි අද කොතැනකද
(යශෝධරාවත)

**අභ්‍යාස**

01. යසෝධරා දේවියගේ දෙමාපියන් කවුද?

02. යසෝධරා දේවිය ළඟ තිබූ ගුණ පහක් ලියන්න.

03. එතුමිය ලැබූ අග තනතුර විස්තර කරන්න.

04. චන්ද කින්නර ජාතකය හදාරා පන්තිය හමුවේ ඉදිරිපත් කරන්න.